# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 11 දරන
# කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 මාර්තු මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 මාර්තු මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි.

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1982 අංක 11 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1982 මාර්තු මස 25 වන දින.]

එල්. ඩී.—ඕ. 32/81.

**1970 අංක 28 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1982 අංක 11 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1970 අංක 28 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. ("ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් මෙහි මින්මතු සඳහන් කරනු ලබන) 1970 අංක 28 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

3. 7 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය:—

"ගෙහිමියකු විසින් යම් ස්ථානයක නතර කරන ලද පහසුකම් නැවත පිහිටුවීම හා කරන ලද අලාභ හානි අලුත්වැඩියා කිරීම ආදිය.

7අ. (1) කොමසාරිස්වරයා විසින් හෝ 7 වන වගන්තිය යටතේ පරීක්ෂණයක් පැවැත්වීමට ඔහු විසින් බලය දෙන ලද යම් රජයේ නිලධරයකු විසින් හෝ එම වගන්තිය යටතේ පවත්වනු ලබන පරීක්ෂණයකින් පසු යම් ස්ථානයක ගෙහිමියා විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් හෝ—

(අ) ඒ ස්ථානයේ යම් කොටසකට අලාභහානි කරනු ලැබූ, යම් කොටසක් ඉවත් කරනු ලැබූ හෝ අයුතු ලෙස වෙනස් කරනු ලැබූ;

(ආ) ඒ ස්ථානයේ කුලී නිවැසියා හෝ එහි පදිංචි තැනැත්තා සඳහා කලින් සලසන ලද යම් පහසුකමක් හෝ සුව පහසුකමක් නවත්වනු ලැබූ හෝ නතර කරනු ලැබූ;

(ඇ) ඒ ස්ථානයේ කුලී නිවැසියා හෝ එහි පදිංචි තැනැත්තා සඳහා සලසන ලද යම් අත්‍යවශ්‍ය සැපයීමක් හෝ සේවයක් අහිමි කරනු ලැබූ, නතර කරනු ලැබූ හෝ නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යාම පැහැර හරිනු ලැබූ;

(ඈ) ඒ ස්ථානයේ කුලී නිවැසියා හෝ එහි පදිංචි තැනැත්තා එහි ප්‍රවේශ වීම වළක්වනු ලැබූ,

ඒ 61107—13,575 (82/01)

බවට ඔහු සෑහීමට පත් වූ අවස්ථාවක, ඔහු විසින් ලියවිල්ලකින් වූ දැන්වීමකින් ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර හෝ ගෙහිමියා විසින් ඒ වෙනුවෙන් කරනු ලබන ඉල්ලීමක් මත කොමසාරිස්වරයා විසින් ඉඩ දෙනු ලබන දීර්ඝ කරන ලද කාලසීමාව ඇතුළත—

(i) ඒ අලාභහානි අලුත්වැඩියා කිරීමට ; හෝ

(ii) ඒ සුව පහසුකම හෝ පහසුකම නැවත පිහිටුවීමට හෝ අලුත්වැඩියා කිරීමට ; හෝ

(iii) ඒ අත්‍යවශ්‍ය සැපයීම හෝ සේවය නැවත පිහිටුවීමට, අලුත්වැඩියා කිරීමට හෝ එය නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යාමට ; හෝ

(iv) ඒ කුලී නිවැසියාට හෝ පදිංචි තැනැත්තාට ඒ ස්ථානයට ප්‍රවේශවීමට ඉඩ දීමට,

ඒ ස්ථානයේ ගෙහිමියාට නියම කරනු ලැබිය හැකි ය.

(2) යම් ස්ථානයක ගෙහිමියා (1) වන උපවගන්තිය යටතේ දෙන ලද දැන්වීමකින් ඔහුට නියම කරන ලද යම් නියමයකට අනුකූලව ක්‍රියා කිරීම ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරන ලද කාලසීමාව ඇතුළත හෝ එම වගන්තිය යටතේ ඔහුට ඉඩ දෙනු ලබන දීර්ඝ කරන ලද කාලසීමාව ඇතුළත පැහැර හරිනු ලබන අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද නිලධරයා විසින් හෝ—

(අ) ඒ ස්ථානයේ කුලී නිවැසියාට ඒ දැන්වීමෙහි සඳහන් කරන ලද අලාභහානි අලුත්වැඩියා කිරීමට හෝ ඒ දැන්වීමෙහි සඳහන් කරන ලද සුව පහසුකම, පහසුකම හෝ අත්‍යවශ්‍ය සැපයීම හෝ සේවය නැවත පිහිටුවීමට, අලුත්වැඩියා කිරීමට හෝ එය නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යාමට විධාන කළ හැකිය ;

(ආ) කුලී නිවැසියාට ඒ අලුත්වැඩියා කිරීම සිදු කිරීමට හෝ ඒ සුව පහසුකම, පහසුකම, අත්‍යවශ්‍ය සේවය හෝ සැපයීම නැවත පිහිටුවීමට, අලුත්වැඩියා කිරීමට හෝ එය නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යාමට නොහැකි යම් අවස්ථාවක, පොදු පහසුකම් පිළිබඳ මණ්ඩලයට ඒ අලාභහානිය අලුත්වැඩියා කිරීමට හෝ ඒ සුව පහසුකම, පහසුකම හෝ අත්‍යවශ්‍ය සැපයීම හෝ සේවය නැවත පිහිටුවීමට, අලුත්වැඩියා කිරීමට හෝ එය නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යාමට විධාන කළ හැකි ය.

(3) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කොමසාරිස්වරයා විසින් කරන ලද නියමයකින් කුලී නිවැසියකුට හෝ ස්ථානයක පදිංචි තැනැත්තාට ඒ ස්ථානයේ යම් අලුත්වැඩියා කිරීම් හෝ නැවත පිහිටුවීම් ක්‍රියාත්මක කිරීමට විධාන කරන ලද අවස්ථාවක, ඒ අලුත්වැඩියා කිරීම හෝ නැවත පිහිටුවීම ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අනුමතය ලබා ගැනීම අවශ්‍ය වන්නේ යම් තැනැත්තකුගේ හෝ යම් පුද්ගල මණ්ඩලයක ද, ඒ තැනැත්තා විසින් හෝ පුද්ගල මණ්ඩලය විසින් හෝ, වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුවද, ඒ කුලී නිවැසියාට, ඒ කුලී නිවැසියා ඒ ස්ථානයේ ගෙහිමියා වූ පරිදි, ඒ අලුත්වැඩියා කිරීම හෝ නැවත පිහිටුවීම ක්‍රියාත්මක කිරීමට, අවශ්‍යතාවෝචිත පරිදි, අවසරය දීම හෝ බලපත්‍රයක් නිකුත් කිරීම හෝ කළ යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් යම් ස්ථානයක කුලී නිවැසියාට හෝ පොදු පහසුකම් පිළිබඳ මණ්ඩලයට යම් ස්ථානයකට කරන ලද යම් අලාභහානියක් අලුත්වැඩියා කිරීමට හෝ කුලී නිවැසියා හෝ ඒ ස්ථානයේ පදිංචි තැනැත්තා සඳහා කලින් සලසන ලද යම් සුවපහසුකමක්, පහසුකමක් හෝ අත්‍යවශ්‍ය සැපයීමක් හෝ සේවයක් නැවත පිහිටුවීමට, අලුත්වැඩියා කිරීමට හෝ නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යාමට විධාන කරනු ලබන අවස්ථාවක, යම් නීතියක හෝ ගිවිසුමක කුමක් සඳහන් වුවද නැතහොත් ඒ ස්ථානයේ ගෙහිමියා ඒ අලුත්වැඩියා කිරීම සිදු කිරීමට හෝ ඒ සුව පහසුකම, පහසුකම හෝ අත්‍යවශ්‍ය සැපයීම හෝ සේවය නැවත පිහිටුවීමට හෝ අලුත්වැඩියා කිරීමට අනුමතය නොදෙනු ලැබූ නමුත්, ඒ කුලී නිවැසියා හෝ ඒ මණ්ඩලය විසින් ඒ අලුත්වැඩියා කිරීම සිදු කිරීම හෝ ඒ සුවපහසුකම, පහසුකම හෝ අත්‍යවශ්‍ය සැපයීම හෝ සේවය නැවත පිහිටුවීම, අලුත්වැඩියා කිරීම හෝ නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යාම කළ හැකි ය. ඒ කුලී නිවැසියාට ඒ අලුත්වැඩියා කිරීම සිදු කිරීමට නැතහොත් ඒ පහසුකම, සුවපහසුකම හෝ අත්‍යවශ්‍ය සැපයීම හෝ සේවය නැවත පිහිටුවීමට, අලුත්වැඩියා කිරීමට හෝ නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය සහාය දීමට කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද නිලධරයා විසින් පොලිසියට නියම කරනු ලැබිය හැකි අතර, එවැනි යම් නියමයකට අනුකූලව ක්‍රියා කිරීම පොලිසියේ කාර්යය වන්නේ ය.

(5) (2) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයකට අනුකූලව යම් ස්ථානයක කුලී නිවැසියා විසින් යම් ස්ථානයක යම් අලුත්වැඩියා කිරීමක් සිදු කරනු ලබන හෝ කුලී නිවැසියා හෝ ඒ ස්ථානයේ පදිංචි තැනැත්තා සඳහා කලින් සලසන ලද යම් පහසුකමක්, සුව පහසුකමක් හෝ අත්‍යවශ්‍ය සැපයීමක් හෝ සේවයක් නැවත පිහිටුවීම, අලුත්වැඩියා කිරීම හෝ නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යාම කරනු ලබන අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද නිලධරයා විසින් ඒ ස්ථානයේ කුලී නිවැසියාගේ හා ගෙහිමියාගේ අදහස් විමසීමෙන් පසු, කුලී නිවැසියා විසින් ඒ අලුත්වැඩියා කිරීම හෝ ඒ පහසුකම, සුව පහසුකම හෝ අත්‍යවශ්‍ය සැපයීම හෝ සේවය නැවත පිහිටුවීම, අලුත්වැඩියා කිරීම හෝ නිසි තත්ත්වයෙන් පවත්වා ගෙන යාම සඳහා යුක්තිසහගත ලෙස දරන ලද මුදල් ප්‍රමාණය, තම අත්සන යටතේ දෙන ලද සහතිකයකින්, තීරණය කරනු ලැබිය යුතු ය. යම් නීතියක ඊට පටහැනිව කුමක් සඳහන් වුව ද, එසේ සහතික කරන ලද මුදල් ප්‍රමාණය, අදාළ මුදල් ප්‍රමාණය සලකා බැලීමෙන් පසු කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද නිලධරයා විසින් තීරණය කරනු ලබන වාරික ගණනකින් කුලී නිවැසියා විසින් ඒ ස්ථානය සඳහා ගෙවිය යුතු මාසික කුලියෙන් අඩු කරනු ලැබිය හැකි ය.

(6) (2) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයකට අනුකූලව පොදු පහසුකම් පිළිබඳ මණ්ඩලය විසින් යම් ස්ථානයක යම් අලුත්වැඩියා කිරීමක් සිදු කරනු ලබන හෝ යම් ස්ථානයක කුලී නිවැසියා හෝ එහි පදිංචි තැනැත්තා සඳහා කලින් සලසන ලද යම් සුව පහසුකමක්, පහසුකමක් හෝ අත්‍යවශ්‍ය සැපයීමක් හෝ සේවයක් නැවත පිහිටුවීම, අලුත්වැඩියා කිරීම හෝ නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යාම කරනු ලබන අවස්ථාවක, යම් නීතියක කුමක් සඳහන් වුව ද, මණ්ඩලය විසින් ඒ අලුත්වැඩියා කිරීම සිදු කිරීම හෝ ඒ සුව පහසුකම, පහසුකම හෝ අත්‍යවශ්‍ය සැපයීම හෝ සේවය නැවත පිහිටුවීම, අලුත්වැඩියා කිරීම හෝ නිසි තත්ත්වයෙන් පවත්වා ගෙන යාම සඳහා දරන ලද වියදම් ඒ ස්ථානයේ ගෙහිමියාගෙන් අයකර ගනු ලැබිය හැකි ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) "කොමසාරිස්වරයා" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'"පොදු පහසුකම් පිළිබඳ මණ්ඩලය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 10 දරන පොදු පහසුකම් පිළිබඳ මණ්ඩලය පනතින් පිහිටුවන ලද පොදු පහසුකම් පිළිබඳ මණ්ඩලය අදහස් වේ;'; තව ද

(ආ) "නෙරපීම" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'"අත්‍යවශ්‍ය සැපයීම හෝ සේවය" යන්නට ජලය සැපයීම, පඩිපෙළවල හා සෝපානවල විදුලි පහන් ද ඇතුළත් වන විදුලි බලය හා විදුලි පහන්, බෙහෙව් හා කසල ශෝධනය හෝ සනීපාරක්ෂක සේවාව ද ඇතුළත් වේ.'.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.